**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය - 2019**

**------------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ ("සමාගම') 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 79, 80 හා 81 ඡේදය ප්‍රකාරව ආදායම් බදු ගණනය කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් සිදු කළ යුතු වුවත් ආයතනය විසින් හෙළිදරව් කර ඇති ආදායම් බදු ගණනය කිරීම සම්බන්ධයෙන් වූ බදු සටහන නිවැරදි ව දක්වා නොතිබුණි | පෙර වර්ෂ වල පරිදි ආදායම් සටහන දැක්වූ අතර ඉදිරියේදී ආදායම් බදු ගණනය සම්බන්ධයෙන් අවශ්‍ය සටහන් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති රු.1,393,185,840 ක් වූ වත්කම් තවදුරටත් භාවිතයේ පැවතියද එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | LKAS 16 දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතියේ ඡේද අංක 79 (B) අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත්, දැනට භාවිතා කරන දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්නට ලැබේ. තවද වර්තමානයේ ක්ෂය අගයන් වාර්ෂිකව පරීක්ෂා කරනු ලබන අතර අදාල ක්ෂය ගැලපීම වාර්ෂිකව සිදු කරනු ලැබේ. සම්පූර්ණයෙන් ක්ෂය කල දේපල පිරියත හා උපකරණ වාර්තාව පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කල හැක. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොලී ආදායම් ලැබීම් රු.110,405,433 ක් වුවද සමාලෝචිත වර්ෂයට අදාල පොලී ආදායම ලෙස රු.99,109,678 ක් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීම හේතුවෙන් මුදල් ප්‍රවාහය රු.11,295,755 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂ වල පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයට පොලී ආදායම ගැලපීම් සිදු කර ඇති පොලී ආදායම් ගැනීමේදී ස්ථාවර තැම්පතු ආදායම මෙන්ම සේවක ණය පොලී ආදායම ගණනය කර ඇත. | වර්ෂයේ මුදල් ප්‍රවාහය නිවැරදිව දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී මාධ්‍ය ජාලය විසින් රු.394,252,692 ක ස්ථාවර තැන්පත් මුදල් කරගෙන තිබුණ ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මූල්‍ය වත්කම් ආයෝජන තුළින් ගලා ආ මුදල් ප්‍රවාහය ලෙස රු.331,930,705 ක් දක්වා තිබීම හේතුවෙන් රු.62,321,987 ක මුදල් ප්‍රවාහයක් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතු සඳහා පොලී ආදායම එකතුව ගැලපීමෙන් පසු නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට පෙර වර්ෂ වලදී පරිදි ගැලපීම් සිදු කර ඇත. | වර්ෂයේ මුදල් ප්‍රවාහය නිවැරදිව දැක්විය යුතුය. |
| (ඇ) | අනෙකුත් ලැබිය යුතු ගිණුම් සඳහා සමාලෝචිත වර්ෂයට අදාලව ආදායම් ප්‍රකාශයට ගලපන ලද රු. 3,380,610 ක හානිකරණ වෙන් කිරීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගලපා නොතිබුණි. | හානිකරන වෙන් කිරීම සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගැලපීම සිදු කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අදාල ගැලපීම් නිවැරදිව කළ යුතුය. |
| (ඈ) | එකම ණයගැතියෙකු වෙනුවෙන් එකම ගනුදෙනුව සඳහා මාධ්‍ය ජාලය විසින් ලෙජර් ගිණුම් දෙකක් නඩත්තු කර තිබුණු අතර එම ණයගැතියා විසින් ගෙවන ලද රු.2,427,600ක් එක් ගිණුමක සටහන් කර තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂය හා රඳවාගත් ලාභය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | එම මුදල මුළු ණයගැති පාලන ගිණුමේ ශේෂයට බලපෑමක් වී නොමැති අතර ඉදිරියේදී එය නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | වර්ෂයට අදාල ණයගැති ශේෂ නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී ණයගැති ගිණුමකට වැඩියෙන් සටහන් වූ රු.2,780,184 ක් ගිණුමවලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හා වසන්තම් ටීවී නාලිකාවට අදාලව කොමිස් වශයෙන් අඩු විය යුතු රු.878,870 ක් ණයගැති ශේෂයක් ලෙස සටහන් වීම හේතුවෙන් ණයගැති ශේෂය රු.3,659,054 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම රු.2,780,184 ක මුදල දැනට වැඩියෙන් ඇති ගිණුම් වලින් නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන අතර රු.878,870 ක මුදල නිවරදි කිරීමට කටයුතු කර ඇත. | මූල්‍ය වර්ෂයේ අවසන් දිනට නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ඊ) | 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.1,037,763 ක් වටිනා ඉංග්‍රීසි චිත්‍රපටි 12 ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ඉදිරියට කරන ලද ගෙවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම චිත්‍රපට අතුරෙන් චිත්‍රපට 4 ක් 2015, 2016 හා 2017 වර්ෂ වල විකාශය වී ඇති අතර ඉදිරියේදී අනෙකුත් චිත්‍රපටද විකාශන අයිතිය පරීක්ෂා කර විකාශනය කිරීමට කටයුතු කරනු ඇත. | අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මාධ්‍ය ජාලය අනුගමනය කරන ක්ෂය ප්‍රතිපත්තිය පැහැදිලිව මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර නොතිබුණු අතර, දක්වා ඇති රේටයන් නිවැරදිව යොදා නොගැනීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට දැක්වෙන ක්ෂය වියදම රු. 1,789,202 ක් වැඩියෙන් හා වත්කම් වල අගය රු.900,941 ක් අඩුවෙන් දක්වා තිබුණි. | (i) ලී බඩු සහ සවිකිරීම් ක්ෂය කිරීමට අදාල ගිණුම්ගතකිරීම නිවැරදි වන අතර පිරිවැයට වඩා ක්ෂය කිරීමක් සිදු කල නොහැක.<br>(ii) ගොඩනැගිලි සඳහා 2020 වර්ෂයේදී ක්ෂය ගණනය කිරීමේදී මෙම අගය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.<br>(iii) ලක්හඬ ගුවන් විදුලිය ගොඩනැගිලි සඳහා පෙර වර්ෂ වල ගිණුම් ගත කල පරිදිම නිවැරදිව ක්ෂය වටිනාකම ගිණුම් ගත කර ඇත.<br>(iv) කාර්යාල උපකරණ ක්ෂය වටිනාකම නිවැරදිව ගිණුම් ගතකර ඇති බව දැක්විය හැක.<br>(v) යන්ත්‍ර හා පිරියත හා සම්ප්‍රේෂණ උපකරණ සඳහා ඉංජිනේරු අංශයේ නිර්දේශ පරිදි ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව නිවැරදිව කටයුතු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කර ඇති ක්ෂය ප්‍රත්පත්තියට අනුකූලව ක්ෂය ගණනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂය තුළ ඇතුළත් රු.7,193,321 ක් හුවමාරු ගණුදෙනු වලින් සමන්විත වූ අතර අදාල සේවා ලබාගෙන එම ගණුදෙනු අවසන් කර තිබුණද, විධිමත් ගිණුම් සටහන් පවත්වා නොගැනීම හේතුවෙන් ණයගැතියන් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී මේ ගැන සොයා බලා ගිණුම් වලින් ඉවත් කර නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි | හුවමාරු සේවා ලබාගත් පසු ඊට අදාල නිවැරදි ගිණුම් සටහන් දැක්විය යුතුය. |

**1.5.3 නොසැසදූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව වසන්තම් ටීවී හි සේවාදායක ණයගැති ශේෂය රු.82,896,053 ක් වූ අතර උපලේඛනඅනුව එය රු.95,481,160 ක් වූයෙන් රු.12,612,107 ක වෙනසක් නිරීක්ෂණය විය. | ණයගැති ශේෂය හා ණයගැති උපලේඛන අනුව ණයගැති ශේෂය රු. 95,481,160 ක් අතර වෙනස වූ රු. 12,612,107 අගයට හේතුව වුයේ හානිකරන වාර්තාව පිළියෙල කිරීමේදී ණයගැති උපලේඛනයේ අඩංගු සෘන ශේෂයන් ඉවත් කිරීමයි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සනාථ කරන උපලේඛණ ඉදිරිපත් කළ යුතුය. |

**1.5.4 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාධ්‍ය ජාලයේ ශුද්ධ වත්කම් 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අඛණ්ඩවම අඩු වී තිබුණු අතර 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අඛණ්ඩව අලාභ ලබා තිබුණි. ඒ අනුව 2019 වර්ෂයේ මාධ්‍ය ජාලයේ මුළු අලාභය රු.582,560,996 ක් වී තිබුණි. | ගුවන් කාල ශ්‍රේණිගත කිරීම් (Ratings) අනුව ආයතනයේ ශ්‍රේණිගත කිරීම ඉතා අඩු තත්වයක පැවතීම හේතුවෙන් අලාභ තත්වය හටගෙන ඇත. | ගුවන් කාල විකුණුම් ආදායම වැඩිකරගෙන අලාභ තත්වය මග හරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.61,398,230 ක් වූ විලම්බිත ආදායම් ශේෂය තුළ වසර 05 ට අඩු ශේෂය රු. 18,248,325 ක් ද, වසර 05 ත් 10 ත් අතර ශේෂය රු.20,859,250 ක් ද, වසර 10 ට වැඩි ශේෂය රු.22,290,655 ක් ද ඇතුළත්ව තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මෙම වර්ෂයේ ගිණුම් වලට ගැනීමට කටයුතු කරනු ඇත. | ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.26,102,278 ක් වූ ප්‍රතිවෙළඳ ණයගැති ශේෂය තුළ ඇතුලත් වසර 05 ක් ඉක්මවූ ශේෂය රු. 14,641,728 ක් සඳහා අදාල සේවාවන් සපයාගැනීමෙන් තොරව හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි. | මෙම ප්‍රති වෙළඳ ගනුදෙනු සම්බන්ධව අදාළ ඉන්වොයිස්පත් හා අනෙකුත් ලියවිලි මුදල් අංශයට ලැබී නොමැති බැවින් මෙම වට්නාකම් ගිණුම් වලට ගැනීමට හා අනෙකුත් ඉදිරි කටයුතු කිරීමට ගැටලුකාරී තත්වයක් පවතී. | අදාල සේවා ලබා ගෙන ප්‍රතිවෙළඳ ණයගැති ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන රු. 118,338,166 ක් වූ සේවාදායක අත්තිකාරම් ශේෂය තුළ වසර 10 ක් ඉක්මවූ ශේෂය රු. 24,347,719 ක් ඇතුළත්ව තිබුණු අතර එම ශේෂය නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | එම සේවාදායකයන් නිවැරදිව හඳුනාගෙන මෙම වර්ෂයේදී ගැලපීම් සිදු කිරීමට කටයුතු කිරීමට ණය පාලන අංශයට දැනුම් දෙන ලදී. | දිගු කාලයක සිට පැවත එන ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දින වන විට ගනුදෙනුකරුවන් වෙත නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ වසර 05 ක් ඉක්මවූ චෙක්පත් 433 ක වටිනාකම රු. 3,888,051 ක් සහ වසර 02 ත් 05 ත් අතර චෙක්පත් 550 ක වටිනාකම රු. 5,494,358 ක් නිරවුල් කිරීමට කටයුතු නොකර අවලංගු කළ චෙක්පත් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සඳහන් කර ඇති අවලංගු කල චෙක්පත් ගිණුම් වලින් ලියා හැර නැවත ආදායමට ගැනීමට විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත පසුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | අවලංගු කළ චෙක්පත්වලට අදාළව ගිණුම්වල ගැලපීම් කර ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඇ) | වර්ෂ 03 කට වඩා පැරණි, හිමිකම් නොපෑ ගෙවිය යුතු ශේෂය රු.974,653 ක් හා 2012 වසරේ සිට පැවත එන එකතුව රු.37,538,476 ක් වූ අනෙකුත් ගෙවිය යුතු ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවිය යුතු වටිනාකම සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන එම ගෙවීම් සම්බන්ධව නිවැරදි තහවුරුවක් ලබා මෙම වර්ෂයේදී ගිණුම් වලට කටයුතු කරනු ඇත. | දිගු කාලයක සිට පැවත එන ශේෂ හඳුනාගෙන නිරවුල් කළ යුතුය. |
| (ඉ) | 2016 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති හඳුනා නොගත් ණයහිමි ශේෂය රු.1,416,677 ක් හා වර්ෂ 03 ක් ඉක්මවා ඇති ආපසු ගෙවිය යුතු තැන්පතු 86 ක එකතුව රු.639,600 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් පිළිබඳව ණය පාලන අංශයට දැනුම් දුන් අතර, එම ණය හිමියන් නිවැරදිව හඳුනා ගෙන මෙම වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත. | සේවා ලබා ගැනීමෙන් පසු ණයහිමියන් සඳහාගෙවීම් කර ගිණුම් වල ගැලපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | | |
| | (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද මෙම වාර්තාවේ දිනය දක්වාම එය ඉදිරිපත් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ලබාදිය යුතු බැවින් දින කිහිපයක ප්‍රමාදයක් සිදුව ඇති අතර, එය 2020 මාර්තු මස 12 වෙනි දින විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර ඇත. | කෙටුම්පත් වාර්ෂික වාර්තාව විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 01/2015 චක්‍රලේඛය | මාධ්‍ය ජාලයේ සභාපති තනතුරේ වරින් වර තිදෙනෙකු සේවය කර තිබුණු අතර චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා හිමිකම ඇති මාසික ඉන්ධන දීමනාව ලීටර් 170 ක් වුවද එම ප්‍රමාණය ඉක්මවා ලීටර් 455 ඉන්ධන ලබාදී තිබුණි. ඊට අමතරව ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී අලෙවි (ආවරණ) හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් හට අනුමත ඉන්ධන දීමනාව ඉක්මවා පිළිවෙලින් ඉන්ධන ලීටර් 1518 ක්, 1716 ක් හා 1640 ක් ලබා දී තිබුණි. | රාජකාරී කටයුතු සඳහා ඉන්ධන නිකුත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) 2019 දෙසැම්බර් 09 දිනැති අංක පීඊඩී 03/2019 චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දී මාධ්‍ය ජාලයේ සේවකයන් සඳහා රු.7,986,000 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | මෙම දීමනා ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් සිදු කරන අතර මෙම ක්‍රමවේදයන් තුලින් සේවක කැපවීම හා අභිප්‍රේරණය වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

| | | | |
|---|---|---|---|
| (i) 2013 ජනවාරි 31 දිනැති අංක 02/2013 දරන චක්‍රලේඛය | ඊ - රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව බැංකු පෙරගෙවුම් කාඩ්පතක් ලබාගත හැකි වුවද මාධ්‍ය | පෙර ගෙවුම් කාඩ්පත් මගින් මෙම ගෙවීම් සිදු කල නොහැකි බැවින් එම කාඩ්පත් අවලංගු | මෙම ආයතනය රාජ්‍ය සමාගමක් බැවින් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව |

| | | |
|---|---|---|
| ජාලය විසින් ලංකා බැංකු ණය කාඩ්පතක් ලබාගෙන තිබුණු අතර ලබාගත හැකි බැංකු පෙර ගෙවුම් කාඩ්පතෙහි උපරිම සීමාව රු. 100,000 ක් වුවද ලබාගෙන ඇති ණය කාඩ්පතෙහි උපරිම සීමාව රු. 900,000 ක් විය. තවද චක්‍රලේඛයේ 06 ඡේදය අනුව පෙරගෙවුම් කාඩ්පත මගින් කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ගිණුම්කරණ පියවරයන් දක්වා තිබුණද මෙම කාඩ්පත සම්බන්ධයෙන් ගිණුම්වල හෙලිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිතව මෙම ණය කාඩ්පත් කාලීන අවශ්‍යතාවය මත ලබා ගෙන ඇත. මෙය පෙර ගෙවුම් කාඩ් පතක් නොවන බැවින් මෙහි උපරිම සීමාව ආයතන විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අනුව සහ වියදම් වල ස්වභාවය අනුව තීරණය කර ලබාගෙන ඇත.<br>මෙම සෑම වියදමක්ම අභ්‍යන්තර විගණන අංශය වෙත පරීක්ෂා කිරීම සඳහා යොමු කිරීම සිදු කරයි. | කටයුතු කළ යුතුය. |

**1.8** **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.9,914,876 ක් වුවද එකතු කළ අගය මත බදු වාර්තාවලට අනුව එය රු.4,532,296 ක් වුයෙන් එකතු කළ අගය මත බදු රු.5,382,580 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වර්ෂය තුලදී ආදායමට අනුව බදු ගෙවීම සිදුවන අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සිදුවන ආදායමේ ගැලපීම් වලට ඉදිරි මාස වලදී ගෙවීම් සිදු කරනු ලබයි. එලෙසම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබෙන බදු තක්සේරු වාර්තා අනුව අවශ්‍ය ගැලපීම් නිවැරදිව කාල පරිච්ඡේද වලදී සිදු කර ඇති බව දන්වමි. | එකතු කළ අගය මත බදු නිවැරදිව ගණනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 571,884,034 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 627,610,711 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 55,726,677 ක් වර්ධනයක් නිරීක්ෂනය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී අනෙකුත් ආදායම් රු.16,001,972 ක් හෙවත් සියයට 41 කින් වැඩි වීමත් වැඩසටහන් වියදම රු. 97,509,232 ක් හෙවත් සියයට 16 කින් අඩුවීමත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ ලාභදායී අනුපාත සහ ද්‍රවශීලතා අනුපාත පහත දැක්වේ

| ලාභදායිත්ව අනුපාත | 2019 | 2018 |
|---|---|---|
| | % | % |
| දළ ලාභ අනුපාතය | 55 | 49 |
| ශුද්ධ ලාභය/(අලාභ) අනුපාතය | (0.5) | (52) |

| ද්‍රවශීලතා අනුපාත | 2019 | 2018 |
|---|---|---|
| ජංගම අනුපාතය (වාර) | 02 | 03 |
| ක්ෂණික අනුපාතය (වාර) | 02 | 03 |

2018 වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ දී දළ ලාභ අනුපාතය සියයට 06 කින් වැඩි වී තිබුණු අතර ඌනතාවය සියයට 51.5 කින් අඩු වී තිබුණි. ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය වාර 01 බැගින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බාහිර පාර්ශ්වයන් විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාධ්‍ය ජාලයට එරෙහිව රු.615,325,000 ක වන්දි ඉල්ලා නඩු 18 ක් පවරා තිබුණු අතර අදාල නඩු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 3,502,115 ක වියදමක් දරා තිබුණි. | ප්‍රවෘත්ති විකාශන කටයුතු චිත්‍රපට විකාශනය කිරීමේදී හා සේවක ගැටලුකාරී අවස්ථා වලදී සේවකයින් විසින් ද නඩු පවරා ඇති අතර එම සියලුම නඩු සම්බන්ධයෙන් ආයතනය කටයුතු කරමින් පවතී. | මාධ්‍ය ජාලයට විය හැකි අලාභ අවම වන අයුරින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සමාගම විසින් රු.14,951,343 ක් අයකර ගැනීම සඳහා සේවාදායක ණයගැතියන්ට එරෙහිව නඩු 09 ක් පවරා තිබුණු අතර එයින් රු. 3,075,357 ක් වූ ණයගැතියෙකු සොයාගැනීමට අපොහොසත් වීමෙන් නඩු කටයුතු නවතා තිබුණි. | නීතිමය කටයුතු සඳහා වැයවන වියදම් ආදිය මෙන්ම ව්‍යාපාර කටයුතු සාර්ථකව සිදු කිරීමට ගනුදෙනු කරුවන්ගේ සුහදතාවය පවත්වා ගැනීමටද අවශ්‍ය වන බැවින් නීතිමය පියවර ගැනීමට පෙර මුදල් අයකර ගැනීමට ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව පමණක් නීතිමය පියවර ගැනීමට යොමු කරනු ලැබේ. | ණය අප්‍රමාදව අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ග ගත යුතුය. |

අප ආයතන විසින් ලබා දෙන ණය වලින් 98% පමණ අයකර ගැනීමට කටයුතු කරන අතර ඉතිරි ඒවා නීති මගින් අය කර ගැනීමට හැකි ඒවා නීති අංශයට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. තවද මෙම වටිනාකම 2001 වසරේ සිට පවතින ශේෂයන් වන අතර මුළු ණයට විකුණුම් මත එම ප්‍රමාණය 1% - 2% අතර පවතින බව කාරුණිකව දන්වා සිටිමි. ගනුදෙනු කරුවන් සම්බන්ධව දැඩි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළහොත් එය විශාල ප්‍රමාණයෙන් ආදායම අඩුවීමට හේතුවනු ඇත.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාධ්‍ය ජාලය විසින් 2013 – 2017 වර්ෂ අතර කාලය තුළ තැන්පත් කරන ලද කෙටිකාලීන හා දිගුකාලීන ස්ථාවර තැන්පතු 2018 හා 2019 වර්ෂ වලදී පිළිවෙලින් රු. 326,513,275 ක් හා රු. 604,748,994 ක් මුදල් කරගෙන තිබුණු අතර ඒ හේතුවෙන් ස්ථාවර තැන්පත් පිළිවෙළින් සියයට 14 කින් හා සියයට 39 කින් සහ පොලී ආදායම පිළිවෙලින් සියයට 15 කින් හා සියයට 31 කින් අඩුවී තිබුණි. | ආයතනයේ පැවති අයහපත් මුදල් ප්‍රවාහ තත්වය හේතු කර ගෙන මෙම ස්ථාවර තැම්පතු, මුදල් කර ගැනීමට සිදු විය. | ආයතනයේ මූල්‍ය තත්වය වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී අයිටීඑන් නාලිකාව විසින් ටෙලිනාට්‍ය 21 ක් මිලදීගෙන තිබුණු අතර ඉන් ටෙලිනාට්‍ය 13 කින් රු. 51,967,769 ක අලාභයක් ලබා තිබුණි. | ටෙලි නාට්‍ය සඳහා ඇති තරඟකාරීත්වය මත පුද්ගලික නාලිකා සඳහා තරඟකාරීත්වයක් ලබාදී ඇති බැවින් සෑම ටෙලි නාට්‍යයක් සඳහාම ලාභ ලැබිය නොහැක. කෙසේ වෙතත් රාජ්‍ය ආයතනයක් වන අප ආයතනයේ වගකීමට අනුව උසස් රසාස්වාදයක් ප්‍රේක්ෂක ජනතාවට ලබාදීම වන බැවින් ඉහල ප්‍රමිතියකින් යුතු නාට්‍ය ලාභ නොලැබුවද විකාශනය කිරීමට සිදුවේ. | ඉහල ප්‍රමිතියකින් යුතු ඉහළ ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් ලබාගත හැකි නාට්‍ය විකාශය කර අලාභ මඟහරවා ගත යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) වගන්තිය ප්‍රකාරව එලඹෙන වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද, මාධ්‍ය ජාලය විසින් 2019 වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම 2019 මැයි 28 දින එනම් මාස 5ක ප්‍රමාදයකින් පසුව අනුමත කර තිබුණු අතර එම කාලය තුළ එකතුව වටිනාකම රු.මිලියන 8.84 ක් වූ ප්‍රසම්පාදන සිදු කර තිබුණි. | අදාළ අංශ විසින් නියමිත තොරතුරු, නියමිත කාලවකවානු තුලදී සැපයුම් අංශය වෙත යොමු කිරීමට ක්‍රියා නොකිරීම හේතුවෙන් 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම 2019 මැයි මාසය දක්වා ප්‍රමාද විය. එතෙක් කාලය තුල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ 2019 වසරේ අයවැය ප්‍රතිපාදන යටතේ ආයතනයේ අවශ්‍යතා සඳහා භාණ්ඩ ප්‍රසම්පාදනය කර ගැනීමට සිදු විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමාද වී අනුමත කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුව රු.මිලියන 232 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යය 45 ක් වර්ෂය තුළදී ඉටුකිරීමට සැලසුම්කර තිබුණද, ඉන් සියයට 10 ක් නියෝජනය වන රු.මිලියන 20 ක් වටිනා ප්‍රසම්පාදන කාර්යයන් පමණක් 2019 අගෝස්තු 30 දින වන විට ඉටුකර තිබුණි. | ආයතනයේ පැවති මූල්‍ය අපහසුතාවය මත මිලදී ගැනීම් අඩු මට්ටමකින් සිදු කරන ලදී. | ආයතනයේ මූල්‍ය තත්වය හා අවශ්‍යතාවල ප්‍රමුඛතාවය හඳුනාගෙන ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතුය. |
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.3.2 (ඇ) ට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කිරීමට ප්‍රථම රු. 3,549,580 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය. | ආයතනයේ මෙහෙයුම් කටයුතු කර ගෙන යාම සඳහා කඩිනමින් මිලදී ගතයුතු භාණ්ඩ සඳහා මුද්‍රා තබන මිල ගණන් විමසීමේදී එම ක්‍රමවේදයම අනුගමනය කර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම අපහසු වන අවස්ථා ඇත. කෙසේවෙතත් තරඟකාරී මිල ගණන් යටතේ, විනිවිදභාවය ආරක්ෂා කර ගනිමින් ලංසු ඇගයීම් කමිටු නිර්දේශ හා ප්‍රසම්පාදන කමිටු අනුමැතීන් යටතේ යොමුගත ප්‍රසම්පාදනයන් සිදු කිරීමට ක්‍රියා කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක. DMS/1590/VOLII හා 2018 මැයි 8 දිනැති ලිපිය මගින් ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණද ඒ අනුව බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත කර ගැනීම සඳහා 2019 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | අවසන් කෙටුම්පත 2020.07.14 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට ඉදිරිපත් කර ඇත. | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අනුමත කාර්යමණ්ඩලයට අයත් නොවන ක්‍රියාකාරී අධ්‍යක්ෂ තනතුරක් සඳහා පුද්ගලයකු බඳවාගෙන 2019 වර්ෂය තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු.550,000 ක් ගෙවා තිබුණි. තවද, අනුමත බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව හා අයදුම්පත් කැඳවීමකින් තොරව තනතුරු 7ක් සඳහා නිලධාරීන් බඳවාගෙන තනතුරු දෙකක් සඳහා උසස්වීම් ලබා දී තිබුණි. | ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2019.05.27 දිනැති එම්එම්/එම්එස් /staff/2019 දරන ලිපිය මගින් මෙම පත්වීම සිදුකර ඇති අතර, මුදල් අමාත්‍යාංශයේ PED 3/2015 හා 2015.06.17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව මාසික දීමනාව රු.75,000/- ක් ක්‍රියාකාරී අධ්‍යක්ෂට ගෙවනු ලබයි. තවද, අංක 327/09 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව සංග්‍රහ දීමනා ලෙස රු. 25,000/-ක් දුරකථන දීමනාව ලෙස රු.10,000/-ක දීමනාවක් මාසිකව ගෙවා ඇත. | අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියකට අනුවබඳවා ගැනීම් කළ යුතුය. |
| (ඇ) | කළමනාකරු අලෙවි තනතුර සඳහා ස්ථිර පදනම මත නිලධාරියකු බඳවා ගැනීමෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. | එවකට සිට සභාපතිතුමියගේ උපදෙස් මත හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මෙම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවාගෙන ඇත. | ස්ථිර කාර්යමණ්ඩලයේ තනතුරු සඳහා ස්ථිර බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ඈ) | මාධ්‍ය ජාලයේ ගණකාධිකාරී තනතුර දරන නිලධාරිණිය විධිමත් පත්කිරීමකින් තොරව 2018 නොවැම්බර් 07 දින සිට කළමනාකරු මුදල් තනතුරෙහි රාජකාරි ඉටුකර තිබුණි. මාධ්‍ය ජාලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මුදල් තනතුර | 2018.11.07 වන දින සිට ගණකාධිකාරී තනතුර දරණ නිලධාරිනිය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ රාජකාරි ඉටු කිරීමට පත් කර ඇත.<br><br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ රාජකාරි ඉටු කිරීම | තනතුරු සඳහා බඳවා ගැනීම් විධිමත් අන්දමින් සිදු කළ යුතුය. |

2017 ජූලි සිට පුරප්පාඩුව පවතින අතර 2019 ජූනි 21 දින සිට ඉහත නිලධාරිණිය එම තනතුරෙහි රාජකාරි ආවරණය කිරීම සඳහා පත්කර තිබුණි. මෙම තනතුරු දෙකෙහිම රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් 2018 නොවැම්බර් 07 දින සිට 2019 ජූලි 31 දින දක්වා කාලය සඳහා වැඩ බැලීමේ දීමනාව හා ඉන්ධන දීමනාව ලෙස රු. 477,086 ක් ගෙවා තිබුණි. එසේ වුවද මෙම නිලධාරිණිය කළමනාකරු මුදල් තනතුරට උසස් කල බව සහ බඳවාගැනීම පිළිබඳ අවසන් තීරණයකට එළඹෙන තෙක් රු.61,809 ක වැටුපක් සහ අනෙකුත් අනුමත දීමනා ලබාදීමට සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් රු.9,635 ක මාසික දීමනාවක් ගෙවීමට 2019 ජූලි 30 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 328/35 මගින් අනුමත කර තිබුණද 2019 සැප්තැම්බර් 03 දිනැති අංක 329/14 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් මෙම පත්වීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත නොකරන බව සහ ඒ සම්බන්ධයෙන් ලබාගන්නා ලද සියලුම දීමනා නීත්‍යානුකූල නොවන බව දක්වා තිබුණි. මේ අනුව මෙම පත්වීම් ගැටළු සහගත විය.

වෙනුවෙන් ඇයට ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12:5:4 වගන්තිය ප්‍රකාරව මාසිකව රු. 9635.83 ක දීමනාවක් ගෙවනු ලබයි. මෙම දීමනාව තවදුරටත් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 328/35 අනුමත කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල තීරණ 332/25 මගින් ඇය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුරේ රාජකාරි ඉටු කිරීමට පත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.